විල්පත්තු රක්ෂිත වනාන්තර කලාපය ආසන්නයේ පිහිටි කල්ලාරු රක්ෂිතය එළිපෙහෙළි කොට ජනාවාස ඉදිකිරීම පිළිබඳ අභියාචනාධිකරණය ලබාදුන් තීන්දුව සම්බන්ධයෙන් පුවත්පත් තුළ පුවත් වාර්තා පළ වී තිබිණි.

මෙම තීන්දුවේ සඳහන් වන්නේ එළිපෙහෙළි කරන්නට යෙදුණු භූමි ප්‍රමාණයට සමාන භූමි ප්‍රමාණයක වන රෝපණය සිදුකරන ලෙසත්, වන සංරක්ෂණ ජනරාල්වරයා විසින් ඊට වැය වන මුදල තක්සේරු කර දැනුම් දුන් විට හිටපු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් විසින් එය ගෙවිය යුතු බවත් වේ.

මෙම පුවත පළ කළ තෝරාගත් සිංහල හා ඉංග්‍රීසි පුවත්පත් (11/17)නිරීක්ෂණය කිරීමේදී දක්නට ලැබුණු කරුණ වූයේ, බොහෝ පුවත්පත් මගින් උක්ත තීන්දුවේ අඩංගු කරුණු වරදවා පළ කොට ඇති බවයි. එනම්, බොහෝ පුවත්පත් සිරස්තලයන් සහ අන්තර්ගතයන් තුළ දැක්වී තිබුණේ, අභියාචනාධිකරණය මගින් කල්ලාරු වල/විල්පත්තු වල එළිපෙහෙළි කළ භූමිය තුළ හිටපු අමාත්‍ය බදියුදීන්ගේ මුදලින් නැවත වන රෝපණය කරන ලෙසින් තීන්දුව ලබාදුන් බවයි. මේ අතරින් ඇතැම් පුවත්පත් තුළ සිරස්තලය වරදවා ගෙන තිබුණද, පුවත් අන්තර්ගතය තුළ තීන්දුවේ අන්තර්ගත අදාළ කරුණ නිවැරදිව සඳහන් කර තිබිණි. තවත් පුවත්පතක් පුවත් අන්තර්ගතය තුළ වැරදි තොරතුර සහ නිවැරදි තොරතුර යන දෙකම දක්වා තිබිණි.

කෙසේ නමුත්, ලංකාදීප පුවත්පතේ පුවත් වාර්තාව තුළ මෙම තීන්දුවේ සඳහන් වන කරුණ නිවැරදිව පළ කොට තිබිණි.

වාර්තාකරණයේදී නිරවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමට මාධ්‍ය සැමවිටම උපරිම උත්සාහ ගත යුතු අතර, එය මාධ්‍ය ආචාර ධර්මයක්ද වේ. එසේ නම්, මෙහි ලංකාදීප හැරෙන්නට අනෙක් පුවත්පත් එම ආචාර ධර්මය උල්ලංඝනය කර ඇත. එසේ නම් එම පුවත්පත් මෙතැනින් එහාට ගත යුතු ආචාර ධාර්මික පියවර වන්නේ නිවැරදි කිරීම් පළ කිරීමයි. එය එසේ වන්නේදැයි අපි බලා හිඳිමු.

**#MediaEthicsSL #lka #SinhalaPress #EnglishPress #Dinamina #Mawbima #Divaina #Aruna #DailyNews #DailyMirror #TheIsland #DailyFT**